# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි

(1973 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන
# පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 24 වන දින]

එල්.ඩී.—ඔ. 53/71.

ඇතැම් ඛනිජ ද්‍රව්‍යවල පරම අයිතිය ශ්‍රී ලංකා ජනරජය වෙත සතු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඛනිජ ද්‍රව්‍ය කැණීම, ඇත්දැයි සොයා බැලීම, රැස් කිරීම, සකස් කිරීම, විකිණීම හා අපනයනය කිරීම විධිමත් කිරීම පිණිස ද, පතල් කම්කරුවන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා සුභ සාධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඛනිජ ද්‍රව්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම පිණිස පිහිටුවන ලද යම් සංස්ථාවක් සඳහා නිශ්චල හෝ චංචල දේපළ අනිවාර්ය යෙන් අත්කර ගැනීම හෝ බලකර ලබා ගැනීම කළ හැකි වීම පිණිස ද ඉහත සඳහන් කරුණුවලට සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය.

## I වන කොටස

## ඛනිජ ද්‍රව්‍යවල අයිතිය හා බලපත්‍ර දීම

2. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත් ව සියලු ඛනිජ ද්‍රව්‍යවල පරම අයිතිය ශ්‍රී ලංකා ජනරජය වෙත මෙයින් සතු කරනු ලැබේ. — ඛනිජ ද්‍රව්‍යවල අයිතිය.

(2) ඛනිජ ද්‍රව්‍ය ඇත්තේ හෝ පිහිටියේ යම් පසක් මත හෝ යම් පසකට යට ද ඒ පස කෙරෙහි හෝ සම්බන්ධයෙන් යම් තැනැත්තකු සතුව තිබිය හැකි අයිතිය පිළිබඳ වූ හෝ අන් ආකාරයක කුමන අයිතිවාසිකමක් ඇත ද, ඛනිජ ද්‍රව්‍ය සතු කිරීමට අදාළ (1) වන උප වගන්තියෙහි විධිවිධාන බල පැවැත්විය යුතු ය.

3. 1971 අංක 13 දරන රජයේ මැණික් සංස්ථා පනතේ හෝ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනතේ හෝ 1968 අංක 46 දරන විකිරණශීලි ඛනිජ වස්තු පනතේ විධිවිධාන අදාළ වන යම් ඛනිජ ද්‍රව්‍යයකට මේ පනතෙහි විධිවිධාන අදාළ නොවන්නේ ය. — මේ පනත ඇතැම් වෙනත් පනත් කෙරෙහි බල නොපැයුතු බව.

4. (1) මේ පනතෙහි විධිවිධාන යටතේ සහ එය යටතේ සාදනු ලබන නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ හැර යම් ඛනිජ ද්‍රව්‍යයක් කැණීම, ඇත්දැයි සොයා බැලීම, රැස් කිරීම, ඉවත් කිරීම, විකිණීම හෝ අපනයනය කිරීම කිසිම තැනැත්තකු විසින් නො කළ යුතු ය : — කැණීම ආදිය බලපත්‍රයක බලය යටතේ විය යුතු බව.

එසේ වුව ද යම් ඛනිජ ද්‍රව්‍යයක් කැණීම, ඇත්දැයි සොයා බැලීම, සකස් කිරීම හෝ රැස් කිරීම, මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුව ආරම්භ කළ යම් තැනැත්තකු බලපත්‍රයක් දරන්නකු නො වුව ද ඒ දිනයෙහි සිට තුන් මසක කාලසීමාවක් හෝ ඒ කාලය

1—බී 70791—9,971 (73/3)

ඇතුළත බලපත්‍රයක් සඳහා ඔහු ඉල්ලුම් කර ඇති අවස්ථාවක ඔහුගේ ඉල්ලීම අවසාන වශයෙන් නිශ්චය කරනු ලබන තුරු ඔහු විසින් නොකඩ ව එසේ කළ හැකි නමුදු ඒ දිනයට පසු ව කණිනු ලබන ඛනිජ ද්‍රව්‍ය කිසිවක් අධ්‍යක්ෂගේ පූර්ව ලිඛිත අනුමතිය ඇති ව මිස පතලෙන් ඉවත් කිරීම හෝ බැහැර කිරීම නොකළ යුතු ය.

(2) යම් ඛනිජ ද්‍රව්‍යයක් කැණීමට මේ පනත යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් ඒ බලපත්‍රයෙහි බලය යටතේ කණිනු ලබන යම් ඛනිජ ද්‍රව්‍යයක අයිතිය බලපත්‍ර ලාභී වෙත පැවරිය හැකි ය.

**බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම.**

5. මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා වූ හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම නියමිත ආකෘතියෙහි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, නියම කරනු ලැබිය හැකි ලේඛන සමග එය යැවිය යුතු ය.

**බලපත්‍ර නිකුත් කිරීම.**

6. (1) 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් ලැබුණු විට, බලපත්‍රයක් නියමිත ගාස්තුව ගෙවූ කල නිකුත් කිරීම හෝ බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම අධ්‍යක්ෂ විසින් කළ හැකි ය.

(2) මේ පනත යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් නියම කරනු ලබන ආකෘතියක විය යුතු අතර එහි ලා දක්වෙන කොන්දේසි කිසිවකට එය යටත් වන්නේ ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් එහි සඳහන් වන කාලසීමාවක් වලංගුව පැවතිය යුතු අතර එය අලුත් කළ හැකි වන්නේ ය.

(4) මේ පනත යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් අන්සතු කළ නොහැකි විය යුතු ය.

**බලපත්‍රය දීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනා කිරීම.**

7. බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් අධ්‍යක්ෂ විසින් කරනු ලබන තීරණයෙන් අතෘප්තියට පත් වන යම් තැනැත්තකු විසින්, එසේ ප්‍රතික්ෂේප කිරීමෙන් පසු දින තිහක් ඇතුළත ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධ ව අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකි ය. ඒ අභියාචනය පිළිබඳ අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර කිසිම අධිකරණයක දී රිට් ආඥාවක් මගින් හෝ අන් ලෙසකින් එය ප්‍රශ්න නො කළ යුතු ය.

**බලපත්‍රය අවසන් කිරීම.**

8. (1) බලපත්‍ර දරන සීමා සහිත සමාගමක් වස්තු භංගත්වයට පත් වන හෝ වස්තු භංගත්වයට පත් වී ඇතැයි විනිශ්චය කරනු ලබන හෝ ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක බලපත්‍රය ද ඒ බලපත්‍රයෙන් පැවරුණු සියලු අයිතිවාසිකම් ද වහාම අවසන් වන්නේ ය.

(2) බලපත්‍රයක් දරන්නකු මිය ගිය හෝ වස්තු භංගත්වයට පත් වන හෝ වස්තු භංගත්වයට පත් වූවෙකැයි විනිශ්චය කරනු ලබන අවස්ථාවක බලපත්‍රය ද ඒ බලපත්‍රයෙන් පැවරුණු සියලු අයිතිවාසිකම් ද වහාම අවසන් වන්නේ ය.

(3) බලපත්‍රයක් දරන හවුල් ව්‍යාපාරයක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක ඒ බලපත්‍රය ද ඒ බලපත්‍රයෙන් පැවරුණු සියලු අයිතිවාසිකම් ද වහාම අවසන් වන්නේ ය.

(4) බලපත්‍රයක් දරන්නකු හවුල් ව්‍යාපාරයක් වූ හා එහි හවුල් කරුවන්ගෙන් කෙනකු මිය ගිය අවස්ථාවක ඒ බලපත්‍රය ද ඒ බලපත්‍රයෙන් පැවරුණු අයිතිවාසිකම් ද වහාම අවසන් වන්නේ ය:

එසේ වුව ද හවුල්කරුවන්ගෙන් කෙනකු මිය යාම හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරෙන පරිදි ක්‍රියාත්මක නොවන අවස්ථාවක, බලපත්‍රය ද ඒ බලපත්‍රය මගින් පවරනු ලබන අයිතිවාසිකම් ද නොවෙනස් ව පවතින්නේ ය.

බලපත්‍රය අවලංගු කිරීම.

9. පහත සඳහන් අවස්ථාවල දී, එනම් :—

(අ) බලපත්‍රයක සඳහන් කොන්දේසි අතුරින් කිසිවක් කඩකරනු ලැබුවහොත් ;

(ආ) බලපත්‍රයක් දරන්නකුට දෙන ලද යම් විශේෂ නියමයක් ක්‍රියාවේ යොදනු නොලැබුවහොත් ;

(ඇ) නාස්තිකාර කැණීමට විරුද්ධව කලින් කරන ලද අවවාද නොතකා එපරිද්දෙන් කැණීම පවත්වා ගෙන යනු ලැබුව හොත් ; හෝ

(ඈ) අධ්‍යක්ෂගේ අවසරය නොමැති ව මාස හයකට වැඩි කාලයක් කැණීමේ කටයුතු අත්හිටුවා තිබෙන අවස්ථාවක

අධ්‍යක්ෂ විසින් බලපත්‍රයක් අවලංගු කළ හැකි ය.

බලපත්‍රය අවලංගු කිරීමට පෙර හේතු දැක්වීමට අවස්ථාවක්.

10. බලපත්‍රයක් අවලංගු කරනු ලැබීමට පෙර, ඒ බලපත්‍රය අවලංගු කිරීමට විරුද්ධ ව පෞද්ගලිකව හෝ නියෝජිතයකු මගින් හේතු දැක්වීමට අවස්ථාවක් අධ්‍යක්ෂ විසින් ඒ බලපත්‍රය දරන්නාට දිය යුතුය.

අවලංගු කිරීමට විරුද්ධ ව අභියාචනා කිරීමේ අයිතිවාසිකම.

11. බලපත්‍රයක් අවලංගු කරමින් අධ්‍යක්ෂ කළ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ අවලංගු කිරීමෙන් පසු දින තිහක් ඇතුළත ඒ අවලංගු කිරීමට විරුද්ධ ව අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකි ය. ඒ අභියාචනය පිළිබඳ ව අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර කිසිම අධිකරණයක දී රිට් ආඥාවක් මගින් හෝ අන් ලෙසකින් එය ප්‍රශ්න නොකළ යුතු ය.

බලපත්‍රය අවසන් වූ විට හෝ අවලංගු වූ විට ඛනිජ ද්‍රව්‍යවල අයිතිය.

12. මේ පනතේ ඉහත සඳහන් විධිවිධාන යටතේ බලපත්‍රයක් අවසන් වන හෝ අවලංගු වන අවස්ථාවක, ඒ බලපත්‍රයේ බලය යටතේ කණින ලදුව ඒ අවසන්වීමේ හෝ අවලංගු වීමේ දිනයෙහි බැහැර නොකරන ලද සියලු ඛනිජ ද්‍රව්‍ය අධ්‍යක්ෂ සතුවිය යුතු අතර ඒ ඛනිජ ද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් විධාන නිකුත් කළ යුතු ය.

බලපත්‍ර නිකුත් කිරීමට අධ්‍යක්ෂ සතු බලතල සීමා කිරීම.

13. (1) අධ්‍යක්ෂ විසින්—

(i) අමාත්‍යවරයාගේ අනුමතිය නොමැතිව,—

(අ) සුසාන භූමි ආඥාපනතේ අර්ථානුකූල වූ යම් සුසාන භූමියක ;

අධි. 231.

(ආ) ගගන යාත්‍රාංගණයක කොටසක් වූ යම් ඉඩමක හෝ ගගන යාත්‍රාංගණයක සිට නියම කරනු ලබන දුර ප්‍රමාණයක් ඇතුළත පිහිටි යම් ඉඩමක;

(ඇ) දුම්රිය මාර්ගයක් සඳහා වෙන් කර ඇති යම් ඉඩමක හෝ දුම්රිය මාර්ගයක සිට නියම කරනු ලබන දුර ප්‍රමාණයක් ඇතුළත පිහිටි යම් ඉඩමක;

(ඈ) වැවක හෝ වැව් කණ්ඩියක සිට නියම කරනු ලබන දුර ප්‍රමාණයක් ඇතුළත පිහිටි යම් ඉඩමක;

අධි. 454

(ඉ) රජයේ ඉඩම් ආඥාපනතෙහි අර්ථානුකූලව ජනරජයට අයිති වෙන් කරන ලද යම් ඉඩමක; හෝ

(ඊ) රජයේ ඉඩම් ආඥාපනතෙහි අර්ථානුකූලව පෙර වෙර ළෙහි

යම් ඛනිජ ද්‍රව්‍යයක් කැණීමට හෝ ඇත්දැයි සොයා බැලීමට;

(ii) අමාත්‍යවරයාගේ ද ආරක්ෂා විෂය භාර අමාත්‍ය වරයාගේ ද අනුමතිය නොමැතිව, ඒ යුද්ධ හමුදාව, නාවික හමුදාව හෝ ගුවන් හමුදාව වෙත පැවරී තිබෙන යම් ඉඩමක යම් ඛනිජ ද්‍රව්‍යයක් කැණීමට හෝ ඇත්දැයි සොයා බැලීමට; සහ

(iii) අමාත්‍යවරයාගේ ද පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ ද අනුමතිය නොමැතිව, යම් පළාත් පාලන ආයතනයක් වෙත පැවරී තිබෙන යම් ඉඩමක යම් ඛනිජ ද්‍රව්‍යයක් කැණීමට හෝ ඇත්දැයි සොයා බැලීමට

බලපත්‍රයක් කිසිම තැනැත්තකුට නිකුත් නොකළ යුතු ය.

(2) මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට අමතරව, අවස්ථාවෝචිත වන පරිදි අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයන් විසින්, ඒ අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයන් විසින් නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත්ව (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම අනුමත කරනු ලැබිය හැකිය. ඒ අනුමතිය යම් කොන්දේසිවලට යටත්ව දෙනු ලැබූ අවස්ථාවක, ඒ කොන්දේසි අධ්‍යක්ෂ විසින් බලපත්‍රයේ සඳහන් කරවිය යුතු ය.

බලපත්‍ර නිකුත් නොකළ යුතු ප්‍රදේශ.
අධි. 188.

14. (අ) පුරාවස්තු ආඥාපනතෙහි 24 වන වගන්තිය යටතේ නියමිත දුර ප්‍රමාණය ඇතුළත පිහිටි යම් ඉඩමක; සහ

(ආ) ඒ ආඥාපනතෙහි කාර්‍යයන් සඳහා පුරාවිද්‍යා ආරක්‍ෂක ප්‍රදේශයක් වශයෙන් ඒ ආඥාපනතෙහි 33 වන වගන්තිය යටතේ ප්‍රකාශිත යම් ඉඩමක

ඛනිජ ද්‍රව්‍ය කැණීමට හෝ ඇත්දැයි සොයා බැලීමට බලපත්‍රයක් අධ්‍යක්ෂ විසින් කිසි ම තැනැත්තකුට නිකුත් නොකළ යුතු ය.

## II වන කොටස

### කාර්ය පරිපාලනය

**15.** භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ මේ පනතෙහි කාර්ය පරිපාලනය භාරව සිටින නිලධරයා වන්නේ ය. *මේ පනතෙහි කාර්ය පරිපාලනය.*

**16.** මේ පනතින් හෝ මේ පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල හෝ කාර්ය අතුරින් කිසිවක් අධ්‍යක්ෂ විසින් පොදුවේ හෝ නිශ්චිත වශයෙන් යම් නිලධරයකුට පැවරිය හැකි අතර, ඒ බලය පැවිච්චි කිරීමට හෝ කාර්ය ඉටු කිරීමට ඒ නිලධරයා වෙත බලය පවරනු ලැබිය යුතු ය. *අධ්‍යක්ෂගේ බලතල හා කාර්ය පැවරීම.*

**17.** මේ පනතෙහි විධිවිධානවලට යටත් ව— *අධ්‍යක්ෂගේ බලතල හා කාර්ය.*

(අ) යම් පතලක් පරීක්ෂා කොට අවශ්‍ය යයි තමා සලකන විමර්ශනයක් හෝ සමීක්ෂණයක් පැවැත්වීමට;

(ආ) කැණීමේ කටයුතු පරිපාලනය කිරීමට සහ යම් පතලක වැඩ කෙරෙන අන්දම ගැන විධාන නිකුත් කිරීමට;

(ඇ) කැණීමේ කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් යම් පීඩාවක් ඇති වී තිබේ ද නැතහොත් ඇතිවෙමින් පවතී ද යන වග නිශ්චය වශයෙන් දැන ගැනීමට;

(ඈ) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පියවර ගැනීමට හෝ විධාන නිකුත් කිරීමට හෝ යම් පීඩාවක් නැවැත්වීමට හෝ ඉවත් කිරීමට;

(ඉ) යම් පතලකට හෝ කැණීමේ කටයුතුවලට අදාළ පොත්, සටහන් හා වෙනත් ලේඛන පරීක්ෂා කිරීමට;

(ඊ) යම් පතලකින් ආදර්ශ කොටස් හෝ නිදර්ශක රැස්කිරීමට,

(උ) යම් පතලක සේවයෙහි යෙදවා ඇති හෝ කැණීමේ කටයුතුවල නියුක්ත යම් තැනැත්තකුගෙන් යම් තොරතුරක් ලබා ගැනීමට

අධ්‍යක්ෂට බලය තිබෙන්නේ ය.

**18.** බලපත්‍ර නිකුත් කිරීම හෝ අලුත් කිරීම සම්බන්ධයෙන් සාදනු ලැබූ යම් නියෝගයක විධිවිධාන අනුව අය විය යුතු සියලු ගාස්තු ඉල්ලා සිටීම, භාරගැනීම සහ අයකර ගැනීම අධ්‍යක්ෂ විසින් කළ හැකි ය. *ගාස්තු අයකර ගැනීම.*

**19.** අධ්‍යක්ෂ විසින් හෝ 16 වන වගන්තිය යටතේ ඔහු විසින් යම් බලයක් පවරා ඇති යම් නිලධරයකු විසින් යම් පතලකට හෝ කැණීමේ කටයුතු පවත්වා ගෙන යනු ලබන යම් ඉඩමකට සියලු යුක්ති සහගත කාලවේලාවලදී ඇතුළු වී— *පතල්වලට ඇතුළු වීමේ අයිතිවාසිකම.*

(අ) අධ්‍යක්ෂ විසින්, ඔහුගේ බලතල අතුරින් කිසිවක් ද;

(ආ) යම් නිලධරයකු විසින්, තමා වෙත පවරා ඇති බලතල ද

ක්‍රියාවෙහි යෙදවිය හැකි ය.

සටහන් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ බලතල.

**20.** නිෂ්පාදන හා විකුණුම් සටහන් ඇතුළත් ව අවශ්‍ය යයි අධ්‍යක්ෂ සලකන සටහන්, පොත් හා වෙනත් ලේඛන තමා විසින් කියවා බැලීම හා පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ විසින් බලපත්‍රයක් දරන්නකුට නියම කළ හැකි ය:

එසේ වුව ද බලපත්‍ර නොලත් සකස් කිරීමේ ක්‍රම හෝ පර්යේෂණ කටයුතු පවත්වා ගෙන යනු ලබන සකස් කිරීමේ ක්‍රම පිළිබඳ වූ සටහන් ඉදිරිපත් කරන ලෙස බලපත්‍රයක් දරන්නකුට බල නො කළ යුතු ය.

අධ්‍යක්ෂ විසින් කරනු ලබන සමීක්ෂණ හා ඛනිජ ද්‍රව්‍ය ඇත්දැයි ඔහු විසින් සොයා බැලීම.

**21.** (1) සමීක්ෂණ කිසිවක් පැවැත්වීමේ හෝ ඛනිජ ද්‍රව්‍ය ඇත්දැයි නිශ්චිත ව දැනගැනීමේ කාර්යයන් සඳහා අධ්‍යක්ෂ විසින් හෝ ඒ සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින්—

(අ) ඒ සමීක්ෂණ පැවැත්වීමේ හෝ ඛනිජ ද්‍රව්‍ය සෙවීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යන්ත්‍රෝපකරණ ඇති ව, ජනරජයට අයිති අත්සතු නො කළ ඉඩම් හැර යම් ඉඩමකට සියලු සුදුසු වේලාවලදී ඇතුළුවීම;

(ආ) ඛනිජ ද්‍රව්‍ය ඇත්දැයි නිශ්චිත ව දැනගැනීම පිණිස අවශ්‍ය වන පරිදි ඉඩමේ මතුපිට පස් ඉවත් කිරීම හෝ වළවල් හෑරීම; සහ

(ඇ) පස්, ගල් හෝ ඛනිජ ද්‍රව්‍ය අතුරින් අවශ්‍ය යයි තමා සලකන ආදර්ශ කොටස් හා නිදර්ශක රැස් කිරීම හා ඉවත් කිරීම

කළ හැකි ය.

(2) ඇත්වීමෙහි නිශ්චිත ව සඳහන් කාර්යය සඳහා ඉඩමට ඇතුළු වීමට තමා අදහස් කරන බවට දැන්වීමක් එසේ ඇතුළුවන දිනයට යටත් පිරිසෙයින් දින දහ හතරකට වත් කලින් ලියවිල්ලකින් සහ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් ඒ ඉඩමේ අයිතිකරුට හා එය පරිහරණය කරන්නාට අධ්‍යක්ෂ විසින් දිය යුතු ය.

(3) ඉඩමට සිදුවන අලාභහානි ද එහි අයිතිකරුට හා එය පරිහරණය කරන්නාට ඇතිවන අපහසුකම් ද හැකිතාක් අඩුකර ගැනීම පිණිස අධ්‍යක්ෂ විසින් ඊට සෑහෙන සියලු ආරක්ෂක විධි විධාන යෙදිය යුතු ය.

(4) සිදු කරන ලද යම් අලාභ හානියක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ විසින් නිශ්චය කරනු ලබන වන්දියක් ඉඩමේ අයිතිකරුට, එය පරිහරණය කරන්නාට හෝ, අවස්ථාවෝචිත වන පරිදි, ඉඩමේ අයිතිකරු හා එය පරිහරණය කරන්නා යන දෙදෙනාටම ගෙවිය යුතු ය.

(5) සමීක්ෂණය අවසානයේ දී ඒ ඉඩමෙන් සියලු යන්ත්‍රෝපකරණ හා උපකරණ ඉවත් කරනු ලැබීමටත් එහි හාරා ඇති සියලු ස්ථාන වසා දමනු ලැබීමටත් අධ්‍යක්ෂ විසින් සැලැස්විය යුතු ය.

22. ජනරජයට අයිති අන්සතු නොකළ ඉඩම්වල ඛනිජ ද්‍රව්‍ය ඇත්දැයි සොයා බැලීම ඉඩම් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, අධ්‍යක්ෂ විසින් නො කළ යුතු ය. ජනරජයට අයිති ඉඩම්වල සමීක්ෂණ පැවැත්වීම හා ඛනිජ ද්‍රව්‍ය ඇත්දැයි සොයා බැලීම.

23. (1) යම් පතලක සිදු ඇති හෝ සිදුවිය හැකි යම් දිය ගැලීමක් හෝ කිඳා බැසීමක් නිසා හෝ මේ පනතෙහි විධිවිධාන අනුව ක්‍රියා නොකිරීම හේතුකොට ගෙන පතලක හෝ පතලක් සමීපයෙහි සිටින යම් තැනැත්තකුට අනතුරක් සිදුවීමේ බියක් ඇති බවට අධ්‍යක්ෂ සෑහීමට පත්වන අවස්ථාවක, බලපත්‍රලාභී හෝ පතලෙහි කළමනාකරු වෙත භාර දෙනු ලබන ලිඛිත ආඥාවක් මගින් ඒ පතලෙහි තවදුරටත් වැඩ කරගෙන යාම, අනතුරු සිදුවීමේ හේතුව ඉවත් කර ඇති බවට තමා සෑහීමට පත්වීමෙන් පසු තමා විසින් ආඥාව පරිච්ඡින්න කරනු ලබන තුරු, තහනම් කිරීම අධ්‍යක්ෂ විසින් කළ හැකි ය. අධ්‍යක්ෂගේ විශේෂ බලය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාර දෙනු ලබන ආඥාවක් භාර දෙනු ලැබූ විගස ම ක්‍රියාත්මක වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ භාර දෙනු ලබන ආඥාවක් කඩකරමින් යම් පතලක වැඩ කර ගෙන යනු ලබන අවස්ථාවක, එහි කළමනාකරු ද බලපත්‍රලාභී ද වරදකරුවෝ වන්නාහ.

24. යම් පතලක නාස්තිකාර කැණීමේ ක්‍රම භාවිත කරනු ලබන බවට අධ්‍යක්ෂ සෑහීමට පත් වන අවස්ථාවක, එබඳු කැණීමේ ක්‍රම භාවිත නොකරන ලෙස ඒ පතලෙහි කළමනාකරුට ඔහු විසින් විධාන නිකුත් කළ යුතු අතර, නාස්තිකාර කැණීම වැළැක්වීම පිණිස භාවිත කළ යුතු ක්‍රම සම්බන්ධයෙන් ඔහු විසින් විධාන නිකුත් කළ හැකි ය. තව ද කළමනාකරු විසින් ඒ විධානවලට අනුකූල ව ක්‍රියා කළ යුතු ය. නාස්තිකාර කැණීම වැළැක්වීම.

25. සෑම පතලක ම පාවිච්චි කරනු ලබන යන්ත්‍රෝපකරණ තමා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන යම් ඉංජිනේරුවකු විසින් සෑම දොළොස් මසක කාලසීමාවක දී එක් වරක් බැගින් පරීක්ෂා කොට අත්හදා බලනු ලැබීමට අධ්‍යක්ෂ විසින් සැලැස්විය යුතු ය. යන්ත්‍රෝපකරණ වාර්ෂිකව පරීක්ෂාකිරීම.

## III වන කොටස

## බලපත්‍රලාභීන්ගේ සහ කළමනාකරුවන්ගේ සාමාන්‍ය කාර්ය

26. (1) පතලක බලපත්‍රලාභී විසින්— කළමනාකරු පත් කිරීම.

(අ) මේ පනත ආරම්භවීමේ දිනයට පෙර ආරම්භ කරන ලද පතලක් සම්බන්ධයෙන් වූ විට ඒ දිනයෙන් පසු එක් මාසයක් ඇතුළත ; සහ

(ආ) ඒ දිනයෙහි හෝ ඉන් පසුව ආරම්භ කරන ලද පතලක් සම්බන්ධයෙන් වූ විට එසේ ආරම්භ කළ දිනයෙන් පසු එක් මාසයක් ඇතුළත ,

පතලෙහි පාලනය හා කළමනාකාරිත්වය භාරව සිටීමට සුදුසු තැනැත්තකු කළමනාකරු වශයෙන් පත් කළ යුතු ය.

(2) යම් කළමනාකරුවකු ධුරය අත්හරින අවස්ථාවක හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක, බලපත්‍රලාභී විසින් ඒ දිනයෙන් පසු එක් මසක් ඇතුළත අලුත් කළමනාකරුවකු පත් කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ කළමනාකරු වශයෙන් පත් කරනු ලබන යම් තැනැත්තකුගේ නම හා ලිපිනය ද සුදුසුකම් හා පළ පුරුද්ද පිළිබඳ විස්තර ද අධ්‍යක්ෂ වෙත නිවේදනය කරනු ලැබිය යුතු ය.

පතලක් ආරම්භ කිරීම පිළිබඳ තොරතුරු සැපයීම.

27. මේ පනත ආරම්භවීමේ දිනයෙන් පසු ව ආරම්භ කරන ලද සෑම පතලක ම කළමනාකරු විසින් එදින සිට එක් මසක් ඇතුළත පහත සඳහන් තොරතුරු, එනම්:—

(අ) පතලෙහි පිහිටීම;

(ආ) පතල ආරම්භ කරනු ලැබූ දිනය;

(ඇ) කැණීමට තිබෙන ඛනිජ ද්‍රව්‍ය පිළිබඳ විස්තර;

(ඈ) පළමු මාස තුනේ දී ක්‍රියාවට යෙදීමට අදහස් කර ඇති වැඩ පිළිවෙලක්;

(ඉ) පළමු මාස තුනේදී කැණීමට අදහස් කර ඇති ඛනිජ ද්‍රව්‍ය ප්‍රමාණය; සහ

(ඊ) ඛනිජ ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනු ලබන කාර්යයන්

යන මේ තොරතුරු අධ්‍යක්ෂ වෙත සැපයිය යුතුය.

ත්‍රෛමාසික වාර වාර්තා.

28. එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවලදී සෑම පතලක ම කළමනාකරු විසින්—

(අ) ඊට කලින් වූ මාස තුනේ දී කණිනු ලැබූ ඛනිජ ද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ විස්තර;

(ආ) ඊට කලින් වූ මාස තුනේ දී සේවයෙහි යොදවනු ලැබූ කම්කරුවන් සංඛ්‍යාව;

(ඇ) කලින් වූ මාස තුන අවසානයේ දී පතලෙහි ගැඹුර; සහ

(ඈ) ඊට කලින් වූ මාස තුනේදී සිදුවූ හදිසි අනතුරු කිසිවක් වේතොත් ඒ පිළිබඳ තොරතුරු

අධ්‍යක්ෂ වෙත සැපයිය යුතු ය.

කැණීමේ කටයුතු පිළිබඳ වැඩ සටහන.

29. සෑම පතලක ම කළමනාකරු විසින් එක් එක් වර්ෂය ආරම්භයේ දී ඒ වර්ෂයේ දී කිරීමට අදහස් කර ඇති කැණීමේ කටයුතු පිළිබඳ සවිස්තර වැඩ සටහනක් අධ්‍යක්ෂ වෙත සැපයිය යුතු ය.

ලොග් පොත සහ නාම ලේඛනය.

30. සෑම පතලක ම කළමනාකරු විසින්—

(1) අධ්‍යක්ෂගේ සහ වෙනත් නිලධරයන්ගේ පාවිච්චිය සඳහා ලොග් පොතක්;

(2) එක් එක් තැනැත්තා සම්බන්ධයෙන්—

(අ) ඔහුගේ ලිපිනය සහ ඔහුගේ ළඟම ඥාතිවරයාගේ නම හා ලිපිනය;

(ආ) ඔහු කරන වැඩෙහි ස්වභාවය; සහ

(ඇ) ඔහු වැඩ කරන කාල වේලාවන් සහ ඔහුගේ විවේක කාලයන්

දැක්වෙන්නා වූ, පතලෙහි සේවයේ නියුක්ත සියලු තැනැත්තන් ගේ නාම ලේඛනයක්; සහ

(3) කිසියම් වේලාවක යම් කම්කරුවකු පතලෙහි කිනම් කොටසක වැඩෙහි නියුක්තව සිටිත් ද යන වග දැක්වෙන නාම ලේඛනයක් හෝ සිතියමක්

අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ආකෘතියක තැබිය යුතුය.

පතල්වල ළිං කැණීම සීමා කිරීම.

31. අධ්‍යක්ෂගේ ලිඛිත අවසරය නොමැතිව පතලක ළිඳක සිට අඩි විස්සක් ඇතුළත අන් කිසි ළිඳක් ඒ පතලෙහි කැණීම නො කළ යුතු අතර, යම් ප්‍රසිද්ධ පාරක හෝ පවු පාරක හෝ දුම්රිය මාර්ග යක මැද සිට අඩි දෙසීයයක් ඇතුළත කිසිම පතල් ළිඳක් නො කැණිය යුතු ය.

වාතාශ්‍රය.

32. (1) අධ්‍යක්ෂගේ මතය අනු ව ප්‍රමාණවත් ලෙස වාතාශ්‍රය නොලබන, පතලක පොළව යට තිබෙන යම් උමගක යම් කම්කරු වකු සේවයෙහි යෙදවීම ඒ පතලෙහි බලපත්‍රලාභී හෝ කළමනාකරු විසින් නොකළ යුතු ය.

(2) නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් ඉක්මවා යම් කලක් වැඩ නොගෙන තිබුණු යම් පතල් ළිඳක නැවත වැඩ ආරම්භ කිරීමට පෙර හානිකර වායුවලින් පරිස්සම්වීම සඳහා නියමිත ආරක්ෂා විධිවිධාන සෑම පතලක ම යොදා ගත යුතු ය.

ඉණිමං ආදිය.

33. සියලුම ඉණිමං, ගමන් මාර්ග, කරකැවෙන දබර, තිරිංග, කඹ, එතුම් ආම්පන්න සහ මුක්කු නිසි ලෙස අලුත් වැඩියා කොට හොඳින් ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයෙන් සියලු අවස්ථාවලදීම තබා ගත යුතු ය.

අනුමත කළ කූඩ සහ බඩුබාන කඹ.

34. පතල් ළිංවල පතල්කරුවන් සහ බඩු ඉහළට යැවීමේ හා පහළට යැවීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද මෝස්තරයකට අනුකූල නොවන කිසිම කූඩයක්, කූඩුවක් හෝ බාල්දියක් පාවිච්චි නොකළ යුතු ය. යම් ඔසොවනුවක හෝ උත්තෝලනයක හෝ බඩු ගොඩ අදින හෝ එතුම් උපකරණයක කාර්යයන් සඳහා කිසිම පතලක් ඇතුළත පුවු පාවිච්චි නො කළ යුතු ය.

ලී ගැසීම, කොටු කිරීම සහ වෙනත් ආරක්ෂා විධිවිධාන.

35. සෑම පතලකම—

(1) සියලු පතල් ළිං, දෝනා, තට්ටු, ඇතුල් මාර්ග සහ පොළව යට දෝරු යන මේවායේ වැඩ කරන හෝ යන එන සියලු දෙනාගේ ම ආරක්ෂාව සුරක්ෂිත වන ආකාරයකින් ඒවාට ලී ගසා මුක්කු තැබීම, අවශ්‍ය වන සියලු අවස්ථා වලදී එසේ කළ යුතු ය;

(2) මිනිසකුට හෝ සතෙකුට සිදු වන යම් අනතුරක් හෝ හානියක් වැළැක්වීම පිණිස අවශ්‍ය වන සියලු වැටවල් සවි කොට ඒවා පවත්වාගෙන යා යුතු ය;

(3) පොළොව යට වැඩ කරන යම් ස්ථානයක සිට පිටවීම හෝ එතැනට බැසීම හෝ එතැනින් ගොඩ ඒම එතුම් උපකරණයක ආධාරයක් නොමැතිව කිරීමට සාර්ථක උපක්‍රම වන ඉනිමං හෝ වෙනත් ක්‍රම සපයා පවත්වා ගෙන යා යුතු ය;

(4) තත් කාලයෙහි පාවිච්චි නොකරනු ලබන හෝ හුළං කටක් වශයෙන් පමණක් පාවිච්චි කරනු ලබන සෑම පතල් ළිඳකම කට ඝන බිත්තියකින් හෝ වැටකින් වට කරනු ලැබිය යුතු ය;

(5) අත්හළ සෑම පතල් ළිඳක් ම තවදුරටත් එය පාවිච්චි කිරීම් අවශ්‍ය නොවූ විගසම සම්පූර්ණයෙන් වසා දැමිය යුතු ය; තවද,

(6) පාවිච්චි කරනු නොලබන සෑම පතල් ළිඳක් ම සම්පූර්ණයෙන් වසා දමනු ලබන තෙක් එය සුරක්ෂිත ව වැටකින් ආවරණය කළ යුතු ය.

පුපුරණ හා දැල් වෙන සුලු ද්‍රව්‍ය ගබඩා කිරීම සීමා කිරීම.

36. (1) නියම කරනු ලබන ස්ථානයක, නියම කරනු ලබන ප්‍රමාණයක්, නියම කරනු ලබන ආකාරයෙන් සහ කොන්දේසිවලට යටත් ව මිස, බෝර වෙඩි බෙහෙත්, විගස පුපුරණ ද්‍රව්‍ය හෝ ඛනිජ තෙල් හෝ වෙනත් දැල්වෙන සුලු තෙල් තොග කිසිවක් හෝ පුපුරණ හෝ අන්තරායදායක ස්වභාවයකින් යුත් වෙනත් ද්‍රව්‍ය කිසිවක් යම් පතලක් හෝ පතල් ප්‍රදේශයක් හෝ ගොඩනැගිල්ලක් ඇතුළත හෝ එබන්දක් අසල ගබඩා කිරීම, තැන්පත් කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම නො කළ යුතු ය.

(2) කිසිම පුපුරණ වෙඩිල්ලක්, ගිනිකූරක් හෝ සේව නූලක් හෝ වහා දැල්වෙන සුලු ද්‍රව්‍යයක් හෝ ද්‍රවයක් අන් කිසි පුපුරණ හෝ දැල්වෙන සුලු ද්‍රව්‍යයක් හෝ ද්‍රවයක් සමග යම් පතලක් හෝ පතල් ප්‍රදේශයක් හෝ ගොඩනැගිල්ලක් ඇතුළත හෝ එබන්දක් අසල ගබඩා නො කළ යුතු ය.

හදිසි පිපිරීම ආදිය පිළිබඳ තොරතුරු.

37. පතලක හෝ පතලක් අසල යම් හදිසි පිපිරීමක්, ජ්වලනයක් හෝ ගින්නක් හටගැනීමක් හෝ ජලය හෝ වායු උත්පන්නයක් ඇති වූ අවස්ථාවක නියම කරනු ලබන දැන්වීමක්, නියම කරනු ලබන ආකෘතියකින් හා කාලයක් ඇතුළත, නියම කරනු ලබන බලධරයන් වෙත පතලේ බලපත්‍රලාභී හෝ කළමනාකරු විසින් ඒ සිදුවීම පිළිබඳව කළ යුතු ය.

බරපතල හදිසි අනතුරු දැනුම් දීම.

38. යම් තැනැත්තකු මරණයට පත්කරන හෝ අනතුරට භාජන වූ තැනැත්තා අනතුරෙන් ඉක්බිතිව ම දින හතක් වැඩට අපොහොසත් කරවන යම් ශාරීරික තුවාලයක් ඔහුට සිදු කරන හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයක හෝ යම් හදිසි

අනතුරක් යම් පතලක සිදු වුවහොත් පතලෙහි කළමනාකරු විසින් ඒ අනතුර සිදුවීමෙන් පසු පැය හතලිස් අටක් ඇතුළත ඒ හදිසි අනතුර පිළිබඳ දැන්වීම නියම කරනු ලබන ආකෘතියකින් අධ්‍යක්ෂ වෙත යැවිය යුතු ය.

39. සතුටුදායක යැයි අධ්‍යක්ෂ විසින් සලකනු ලබන නිෂ්පාදන තත්ත්වයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය වන සියලු පියවරවල් සෑම පතලක ම කළමනාකරු විසින් ගත යුතු අතර, ඒ නිෂ්පාදන තත්ත්වය පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ විසින් දෙනු ලබන යම් විධානයක් ඒ කළමනාකරු විසින් ක්‍රියාත්මක කළ යුතු ය. සතුටුදායක නිෂ්පාදන තත්ත්වයක් පවත්වාගෙන යායුතු බව.

40. යම් පතලක නිෂ්පාදනය නතර වන හෝ අත්හිටුවනු ලබන අවස්ථාවක ඒ පතලෙහි කළමනාකරු විසින් ඒ නතරවීම හෝ අත්හිටු වීම පිළිබඳ ව අධ්‍යක්ෂ වෙත ලියවිල්ලකින් නිවේදනය කළ යුතු අතර ඒ නතරවීමේ හෝ අත්හිටුවීමේ හේතුව ද ප්‍රකාශ කළ යුතු ය. නිෂ්පාදනය අත්හිටුවීම.

41. බලපත්‍රයක නිශ්චිත ව සඳහන් යම් ඛනිජ ද්‍රව්‍යයක් කැණීමට ඒ බලපත්‍රයෙන් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු ඒ බලපත්‍රය මගින් කැණීමට තමාට බලය පවරනු නොලැබූ අන් කිසි ඛනිජ ද්‍රව්‍යයක් සොයා ගන්නා අවස්ථාවක, ඔහු විසින් හෝ ඒ පතලෙහි කළමනාකරු විසින් ඒ සොයා ගැනීම අධ්‍යක්ෂ වෙත නිවේදනය කළ යුතු අතර, ඒ ඛනිජ ද්‍රව්‍ය කැණීම, ගබඩා කිරීම සහ බැහැර කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ විසින් දෙනු ලබන විධාන ක්‍රියාත්මක කළ යුතු ය. වෙනත් ඛනිජ ද්‍රව්‍ය සොයා ගැනීම.

## IV වන කොටස

### පතල්වල කම්කරුවන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුභ සාධනය

42. කිසි ම ස්ත්‍රියක් ඇගේ වයස කුමක් වුව ද, කිසි ම පතලක පොළව යට කිසි ම වේලාවකදී වැඩ නො කළ යුතු ය ; නැතහොත් එවැනි ස්ත්‍රියක එසේ වැඩ කිරීමට යොදවා ගැනීම හෝ එවැනි ස්ත්‍රියකට එසේ වැඩ කිරීමට අවසර දීම නො කළ යුතු ය. ස්ත්‍රීන් සේවයෙහි යෙදවීම සීමා කිරීම.

43. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වා තිබෙන පරිදි හැර කිසි ම බාලයකු පතලක පොළව යට වැඩ නො කළ යුතු ය ; නැත හොත් එවැනි බාලයකු එසේ වැඩ කිරීමට යොදවා ගැනීම හෝ බාලයකුට එසේ වැඩ කිරීමට අවසර දීම නොකළ යුතු ය. බාලයන් සේවයෙහි යෙදවීම සීමාකිරීම.

(2) වයස අවුරුදු දහසය සම්පූර්ණ කර නොමැති කිසි ම බාලයකු කිසි ම පතලක පොළව යට වැඩ නො කළ යුතු ය ; නැතහොත් එවැනි බාලයකු එසේ වැඩ කිරීමට යොදවා ගැනීම හෝ එවැනි බාලයකුට එසේ වැඩ කිරීමට අවසර දීම නො කළ යුතු ය.

(3) වයස අවුරුදු දහසය සම්පූර්ණ වූ සහ පතලක වැඩ කිරීමට කැමති යම් බාලයකුගේ හෝ ඒ බාලයාගේ මවගේ හෝ පියාගේ හෝ භාරකරුගේ, හෝ ඒ බාලයා වැඩ කිරීමට කැමැති පතලෙහි කළමනාකරුගේ ඉල්ලීම පිට වෛද්‍ය නිලධරයා විසින් ඒ බාලයා පරීක්ෂා කළ යුතු අතර, ඔහුට වයස අවුරුදු දහසය සම්පූර්ණ වී ඇතැයි ද මුළු දවසම පතලක වැඩ කිරීමට ඔහු සුදුසු යයි ද වෛද්‍ය නිලධරයා සෑහීමට පත් වුවහොත්, ඒ අනුව යෝග්‍යතා සහතික යක් ඒ නිලධරයා විසින් නිකුත් කළ යුතු ය.

(4) බාලයකු සම්බන්ධයෙන් නිකුත් කරන ලද යෝග්‍යතා සහතිකයක් පතලක කළමනාකරු වෙත පළමු කොට තැන්පත් කර ඇතහොත් මිස, ඒ බාලයා ඒ පතලෙහි වැඩ නො කළ යුතුය; නැතහොත් එවැනි බාලයකු එසේ වැඩ කිරීමට යොදවා ගැනීම හෝ එවැනි බාලයකුට එසේ වැඩ කිරීමට අවසර දීම නො කළ යුතු ය.

(5) කම්කරුවකු වශයෙන් බාලයකු සේවයෙහි යොදවනු ලබන අවස්ථාවේ දී (4) වන උපවගන්තිය යටතේ තැන්පත් කරන ලද යෝග්‍යතා සහතිකය පිළිබඳ සඳහනක් ඇති ලාංඡනයක් පතලෙහි කළමනාකරු විසින් ඒ බාලයාට නිකුත් කළ යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද ලාංඡනය තමා වැඩ කරන අතර තමා ළඟ ඇති ව සිටිතහොත් මිස, කිසි ම බාලයකු පතලක වැඩ නො කළ යුතු ය; නැතහොත් එවැනි බාලයකුට එසේ වැඩ කිරීමට අවසර නො දිය යුතු ය.

(7) පතලක වැඩ කරන යම් බාලයකු පතල් පරීක්ෂකයකුගේ හෝ අධ්‍යක්ෂ විසින් යථා පරිදි බලය පවරනු ලැබූ අන් කිසි නිලධර යකුගේ ඉල්ලීම පිට යම් අවස්ථාවක දී වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, පතලෙහි වැඩ කිරීමට ඔහු තව දුරටත් සුදුසු නැතැයි ඒ පරීක්ෂණයේ දී සොයා ගනු ලැබුවහොත් ඔහුගේ යෝග්‍යතා සහතිකය වෛද්‍ය නිලධරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ ස්වකීය යෝග්‍යතා සහතිකය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සෑම බාලයකු ම පතලෙහි කළමනාකරු විසින් වහාම සේවයෙන් අස් කරනු ලැබිය යුතු ය.

බාලයන්ගේ වැඩ කිරීමේ කාල වේලා.

44. (1) කිසි ම බාලයකු රාත්‍රි කාලයේ දී කිසි ම පතලක වැඩ නො කළ යුතු ය; නැතහොත් එවැනි බාලයකුට එසේ වැඩ කිරීමට අවසර නොදිය යුතු ය.

(2) ආහාර ගැනීම හා විවේකය සඳහා පැයක් ඇතුළුව කිසි ම දිනයක පැය අටකට වැඩි කාලයක්, හෝ කිසි ම අනුක්‍රමික දින හයක දී පැය හතලිස් හතරකට වැඩි කාලයක් පතලක පොළව යට වැඩ කිරීමට කිසි ම බාලයකුට අණ කිරීම හෝ බල කිරීම නොකළ යුතු ය.

(3) පතලක වැඩ කරන සෑම බාලයකුගේම වැඩ කිරීමේ කාල වේලා කිසි ම දිනයක පැය දහයක කාලයක් ඉක්මවා පැතිර නොයා යුතු පරිදි පිළියෙල කරනු ලැබිය යුතු ය.

(4) එක් දිනයක් සඳහා (2) වන උපවගන්තිය මගින් නියමිත උපරිම පැය ගණන යම් දිනයක යම් පතලක කලින් වැඩ කර සිටින කිසි ම බාලයකු එදින වෙන යම් පතලක වැඩ නො කළ යුතු ය; නැතහොත් එසේ වැඩ කිරීමට එවැනි බාලයකුට අවසර නො දිය යුතු ය.

වැඩිහිටියන්ගේ වැඩ කිරීමේ කාල වේලා.

45. (1) ආහාර ගැනීම හා විවේකය සඳහා පැයක් ඇතුළු ව කිසියම් දිනයක පැය අටකට වැඩි කාලයක්, හෝ කිසියම් අනුක්‍රමික දින හයක දී පැය හතලිස් අටකට වැඩි කාලයක් පතලක පොළව යට වැඩ කරන ලෙස කිසි ම වැඩිහිටියකුට අණ කිරීම හෝ බල කිරීම නොකළ යුතු ය.

(2) පතලක වැඩ කරන සෑම වැඩිහිටියකුගේ වැඩ කරන කාල වේලා කිසි ම දිනයක පැය දහයක කාලය ඉක්මවා පැතිර නොයා යුතු පරිදි පිළියෙල කරනු ලැබිය යුතු ය.

(3) යම් එක් දිනයක් සඳහා (1) වන උපවගන්තිය මගින් නියමිත උපරිම පැය ගණන යම් දිනක යම් පතලක කලින් වැඩ කර සිටින කිසි ම වැඩිහිටියකු එදින වෙන යම් පතලක වැඩ නො කළ යුතුය; නැතහොත් එසේ වැඩ කිරීමට එවැනි වැඩිහිටියකුට අවසර නො දිය යුතු ය.

(4) පොදුවේ සියලු ම පතල් සම්බන්ධයෙන් වූ විට හෝ නිශ්චිතව සඳහන් යම් කිසි පතල් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් වූ විට (1) වන උපවගන්තියෙහි දැක්වෙන වැඩිහිටි කම්කරුවන්ගේ වැඩ වේලාවල් දීර්ඝ කරන වෙනත් සීමා නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය; තවද ඒ අනුව එබඳු පතලකට හෝ පතල්වලට මේ වගන්තිය අදාළ වීමේ දී, (1) වන උපවගන්තියෙහි දැක්වෙන සීමා වෙනුවට එලෙස නියමිත සීමා ආදේශ කරන ලද්දාක් මෙන් එය තේරුම් ගත යුතු ය.

පතලකට බැසීමේ දී හා ඉන් ඉහළට නැගීමේදී ගත වන කාලය.

46. මේ පනතෙහි කාර්යයන් සඳහා පතලකට බැසීමේ දී හා එයින් ඉහළට නැගීමේ දී කම්කරුවකු විසින් ගත කරනු ලබන කාලය ඒ පතල ඇතුළත පොළව යට වැඩ කිරීමේ දී ගත කරනු ලබන කාලය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

සෞඛ්‍ය ආරක්ෂක හා වෛද්‍ය උපකරණ.

47. (1) එක් එක් පතලෙහි කම්කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා .—

(අ) බීමට සුදුසු ජලය සහ සේදීම සඳහා ජලය ;

(ආ) වැසිකිළි ඉඩකඩ ; සහ

(ඇ) පතුරු, වෙලුම් පටි හා වෛද්‍ය අවශ්‍යතා

නියම කරනු ලබන ආකාරයකින් සහ තත්ත්වයන්ට හා විස්තර වලට අනුකූල ව සැපයිම කළ යුතු ය.

(2) සාමාන්‍යයෙන් කම්කරුවන් සේවයෙහි යොදවනු ලබන සෑම පතලක ම භූමි භාගයෙහි—

(අ) නියම කරනු ලබන ප්‍රමාණයක ගිලන් ඇඳන්, මෙවලම්, ඖෂධ වර්ග හා අමතර උපකරණ සවි කොට ඇත්තා වූ ද එසේම නියම කරනු ලැබූ තත්ත්වයන්ට අනුකූල වූ ද විශේෂ කාමරයක්, හදිසි අනතුරක් සිදු වූ විට ප්‍රථමාධාර දීමේ කාර්යයන් සඳහා සපයා පවත්වා ගෙන යා යුතු ය; තව ද

(ආ) ප්‍රථමාධාර දීම සම්බන්ධයෙන් නියම කරනු ලබන තත්ත්වයකට පුහුණුව ලත් ස්ථිර කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයකු පතලෙහි පොළව යට යම් වැඩක් කරගෙන යනු ලබන සියලු අවස්ථාවන්හි දී සේවයෙහි නියුක්ත ව සිටිය යුතු ය.

කම්කරුවන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා සුභ සාධනය පිළිබඳ නියෝග.

48. පතල්වල කම්කරුවන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා සුභ සාධනයට අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග මගින් විධිවිධාන සැලැස්විය හැකි ය.

## V වන කොටස

## පතල් කර්මාන්තය දියුණු කිරීම සඳහා වූ සංස්ථා

පතල් කර්මාන්තය දියුණු කිරීම පිණිස පිහිටුවනු ලැබූ සංස්ථා වලට මේ පනතෙහි විධිවිධාන අදාළ වන බව.

49. 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතෙහි 2 වන වගන්තිය යටතේ පනවනු ලබන ආඥාවක් මගින් ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් යම් ඛනිජ ද්‍රව්‍යයක් කැණීමේ, ඇත්දැයි සොයා බැලීමේ, සකස් කිරීමේ, විකිණීමේ හා අපනයනය කිරීමේ කාර්යය සඳහා කාර්මික ව්‍යාපාරයක් පිහිටුවා පවත්වා ගෙන යාම සඳහා සංස්ථාවක් අමාත්‍යවරයා විසින් පිහිටුවනු ලබන අවස්ථාවක, ඒ පනතෙහි විධිවිධානවලට අතිරේකව මේ පනතෙහි විධිවිධාන ඒ සංස්ථාවට අදාළ විය යුතු ය. එබඳු යම් කාර්යයක් සඳහා වූ කාර්මික ව්‍යාපාරයක් මෙහි මින් මතු "නිශ්චිත ව්‍යාපාරයක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

නිශ්චිත ව්‍යාපාරයක නියුක්ත වීමේ හෝ එබන්දක් පවත්වාගෙන යාමේ තනි අයිතිවාසිකම සංස්ථාව වෙත ආඥාවක් මගින් පැවරීමට අමාත්‍යවරයා සතු බලය.

50. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් ඒ ආඥාවෙහි සඳහන් කරනු ලබන සංස්ථාවේ යම් නිශ්චිත ව්‍යාපාරයක නියුක්ත වීමේ හෝ එය පවත්වාගෙන යාමේ අයිතිවාසිකම්, එම ආඥාවෙහි සඳහන් කරනු ලබන දිනයක සිට තනිකර ම ඒ සංස්ථාව සතුවිය යුතු යයි අමාත්‍යවරයා විසින් කලින් කල ප්‍රකාශ කළ හැකි ය. එබඳු යම් ආඥාවක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම ඊට සමාන ආඥාවක් මගින් අමාත්‍යවරයා විසින් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලැබූ ආඥාවක සඳහන් වන සංස්ථාවෙහි යම් නිශ්චිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් එම ආඥාව වලංගුව පවත්නා තාක් කල් ඒ සංස්ථාව හැර අන් කිසි ම තැනැත්තකු එකී නිශ්චිත ව්‍යාපාරයෙහි නියුක්ත වීම හෝ එය පවත්වා ගෙන යාම නො කළ යුතු ය.

සංස්ථාවෙහි කාර්යයන් සඳහා අවශ්‍ය දේපළ සම්බන්ධයෙන් හිමිකර ගැනීමේ හෝ හිමිකර ගැනීම අත් හැරීමේ දැන්වීම.

51. (1) සංස්ථාවේ යම් නිශ්චිත ව්‍යාපාරයකට සමාන වූ හෝ සාරානුකූලව සමාන වූ යම් ව්‍යාපාරයක නියුක්තවීමේ හෝ එය පවත්වාගෙන යාමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලැබ ඇති හෝ පාවිච්චි කර ගෙන යනු ලබන නැතහොත් පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබූ, මුදලක් නොවන අන් නිශ්චල හෝ චංචල දේපළක් සංස්ථාවෙහි කාර්යයන් සඳහා අවශ්‍ය බව අමාත්‍යවරයා විසින් බලය පවරනු ලැබූ සංස්ථාවෙහි යම් නිලධරයකු විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ("හිමිකර ගැනීමේ දැන්වීමක්" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන) දැන්වීමකින් ප්‍රකාශ කළ හැකි ය. ඒ දේපළ "නිවේදිත දේපළ" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

(2) යම් දේපලක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන හිමිකර ගැනීමේ දැන්වීමක් පළ කිරීම, ඒ දේපළ සංස්ථාවෙහි කාර්යයන් සඳහා අවශ්‍ය බවට තීරණාත්මක සාක්ෂි වන්නේ ය.

(3) හිමිකර ගැනීමේ දැන්වීමක් (1) වන උපවගන්තිය යටතේ පළ කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් බලය පවරනු ලැබූ සංස්ථාවෙහි යම් නිලධරයකු විසින් කලින් කල ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මේ පනතෙහි "හිමිකර ගැනීම අත් හැරීමේ දැන්වීම" යනුවෙන් සඳහන් කරනු ලබන) දැන්වීමකින් හිමිකර ගැනීමේ දැන්වීමෙහි ඇතුළත් වූ ද හිමිකර ගැනීම අත් හැරීමේ දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් වූ ද දේපළෙහි සමස්තයම හෝ යම් කොටසක් පිළිබඳ ව සංස්ථාවේ කාර්යයන් සඳහා වූ අවශ්‍යතාව අත් හළ හැකි ය.

(4) කිසිම තැනැත්තකු විසින්—

(අ) හිමිකර ගැනීමේ දැන්වීමක නිශ්චිත ව සඳහන් කරනු ලැබූ හා හිමිකර ගැනීම අත් හැරීමේ දැන්වීමකින් හිමිකර ගැනීම අත් හරිනු නොලැබූ යම් දේපළක්; හෝ

(ආ) ඒ දේපළ සම්බන්ධයෙන් වූ අයිතිවාසිකම් කිසිවක්

සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සංස්ථාව නොවන වෙන යම් තැනැත්තකුට බදු දීම, උකස් කිරීම, අන් සතු කිරීම, පැවරීම හෝ කවර ආකාරයකින් වුව ද එවැන්නකු වෙත බැහැර කිරීම නො කළ යුතු ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් කරනු ලැබූ හෝ ක්‍රියාත්මක කරනු ලැබූ යම් බද්දක්, උකසක්, අන් සතු කිරීමක්, පැවරීමක් හෝ බැහැර කිරීමක් ශූන්‍ය හා බල රහිත වන අතර, නීතියෙහි ලා බලපෑමක් හෝ වලංගු භාවයක් නො මැත්තේ ය.

(6) බලයලත් යම් නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් යම් තැනැත්තකු විසින්, ඒ ඉල්ලීමෙහි දැක්වෙන යම් තැනැත්තකු වෙත එසේ දැක්වෙන්නා වූ ද හිමිකර ගැනීමේ දැන්වීමක ඇතුළත් කරනු ලැබූ ද යම් චංචල හෝ නිශ්චල දේපළක් පිළිබඳ තොරතුරු සැපයිය යුතු ය.

(7) (අ) (4) වන උපවගන්තිය කඩ කරමින් යම් නිවේදිත දේපළක් බදු දෙන, උකස් කරන, පවරන හෝ අන් ලෙසකින් බැහැර කරන; හෝ

(ආ) (6) වන උපවගන්තියෙහි සඳහන් තොරතුරු සැපයීම ඕනෑකමින් ම පැහැර හරින, හෝ ඒ තොරතුරු සියල්ල ම හෝ ඉන් යම් කොටසක් ඕනෑකමින් ම වසන් කරන, හෝ තමා සපයන තොරතුරු අසත්‍ය හෝ වැරදි බව දැන දැන ම ඒ තොරතුරු සපයන; හෝ

(ඇ) යම් නිවේදිත දේපළක් ඕනෑකමින් ම හෝ නොසැලකිල්ලෙන් විනාශ කරන හෝ ඊට හානි කරන හෝ විනාශ කරනු ලැබීමට සලස්වන හෝ ඊට හානි කරනු ලැබීමට සලස්වන; හෝ

(ඇ) යම් නිවේදිත දේපලක් ඉවත් කරන, එහි පිහිටීම හෝ එය පිහිටි ස්ථානය වෙනස් කරන හෝ එහි ස්වභාවය වෙනස් කරන හෝ ඒ ඉවත් කිරීම, වෙනස හෝ වෙනස් කිරීම කරවන

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකරුවෙක් වන්නේ ය.

(8) (අ) යම් නිවේදිත දේපලක් පරීක්ෂා කරන ලෙස ඒ සඳහා සංස්ථාව විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට බලය පවරමින් සහ තම සන්තකයෙහි හෝ භාරයෙහි ඒ දේපල ඇතිව සිටින තැනැත්තන්ට ඒ පිළිබඳ වූ පරීක්ෂණයට ඉඩ දෙන ලෙස හා ඊට සහාය වන ලෙස නියම කරමින් ;

(ආ) යම් නිවේදිත දේපලක තත්ත්වය පිළිබඳ වූ වාර්තාවක් සංස්ථාව විසින් හෝ එහි බලය යටතේ පිළියෙල කිරීම සහ ඉන් පසුව සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි වන පරිදි විධිවිධාන සලස්වමින් ;

(ඇ) ඒ වාර්තාව අදාළ වන දේපළ කෙරෙහි සම්බන්ධතාවක් ඇති තැනැත්තන් වෙත ඒ වාර්තාවෙහි හෝ එහි යම් සංශෝධනයක පිටපත් භාර දෙනු ලැබීමට විධිවිධාන සලස්වමින් ;

(ඈ) වාර්තාවෙහි හෝ එහි යම් සංශෝධනයක පිටපත් භාර දෙනු ලැබ සිටින තැනැත්තන් විසින්, තමා ඒ වාර්තාවට හෝ සංශෝධනයට එකඟ වන්නේ ද හෝ නොවන්නේ ද යන වග සංස්ථාවට දන්වන ලෙස සහ ඔවුන් එකඟ නොවෙත් නම්, ඔවුන්ට තිබිය හැකි විරෝධතා සහ විරෝධතාවලට හේතු නිශ්චිතව සඳහන් කරන ලෙස සහ ඒ විරෝධතාවන් සනාථ කිරීම පිණිස ඔවුන් පිහිට පතා සිටින සියලු ලේඛන ඉදිරිපත් කරන ලෙස නියම කරමින් ;

(ඉ) සංස්ථාවෙහි පූර්ව අනුමතිය නොමැති ව යම් නිවේදිත දේපලකට වැඩි දියුණු කිරීම් හෝ වෙනස් කිරීම් කිසිවක් කිරීම තහනම් කරමින් ; සහ

(ඊ) ඉහත කී කරුණුවලට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ සියලු කරුණු සඳහා විධිවිධාන සලස්වමින්

මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(9) මේ පනතෙහි කාර්යයන් සඳහා "බලය ලත් නිලධරයා" යන යෙදුමෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති හෝ ඒ සභාපති විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ සංස්ථාවෙහි යම් අධ්‍යක්ෂවර යෙක් හෝ නිලධරයෙක් අදහස් වේ.

ඇතැම් දේපළ සංස්ථාව වෙත අනිවාර්යයෙන් පවරාදීම.

52. (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ("සතු කිරීමේ ආඥාව" යනුවෙන් මේ පනතෙහි සඳහන් කෙරෙන) ආඥාවක් මගින්, ඒ ආඥාවෙහි දක්වෙන දිනයක සිට, හිමිකර ගැනීම අත් හැරීමේ දැන්වීමක් මගින් හිමිකර ගැනීම අත්හරිනු නො ලැබූ යම් නිවේදිත දේපලක් සංස්ථාව සතු කළ හැකි ය.

(2) සතු කිරීමේ ආඥාවක් ක්‍රියාත්මකවීමට පෙර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය විමසීමෙන් පසු, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් ඒ සතු කිරීමේ ආඥාව ක්‍රියාත්මක වන දිනය කලින් කල වෙනස් කළ හැකි ය.

(3) සතු කිරීමේ ආඥාවක නිශ්චිතව සඳහන් යම් දේපළක් පිළිබඳ පරම අයිතිය ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් දිනයෙහි සිට සියලු බැඳීම්වලින් තොර ව සංස්ථාව වෙත ලබාදීම එම ආඥාවේ බලපෑම වන්නේ ය.

නිවේදිත දේපළ සංස්ථාවේ කාර්යය සඳහා බලකර ලබා ගැනීම.

53. (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ("බලකර ලබා ගැනීමේ ආඥාව" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන) ආඥාවක් මගින්, ඒ ආඥාවෙහි දක්වෙන දිනයක සිට, සංස්ථාවේ යම් නිශ්චිත ව්‍යාපාරයක කාර්යයන් සඳහා සංස්ථාව විසින් තාවකාලික ව පාවිච්චි කරනු ලැබිය හැකි වනු පිණිස චංචල හෝ නිශ්චල දේපළක් වන යම් නිවේදිත දේපළක් බල කර ලබා ගත හැකි ය.

(2) බලකර ලබා ගැනීමේ ආඥාවක් ක්‍රියාත්මකවීමට පෙර අමාත්‍ය වරයා විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය විමසීමෙන් පසු ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් ඒ බලකර ලබා ගැනීමේ ආඥාව ක්‍රියාත් මක වන දිනය කලින් කල වෙනස් කළ හැකි ය.

(3) බලකර ලබා ගැනීමේ ආඥාවක දක්වෙන දිනයෙහි සිට ඒ ආඥා වෙහි දක්වෙන දේපළ පිළිබඳ සන්තකය ලබා ගැනීමටත් සංස්ථාවේ යම් නිශ්චිත ව්‍යාපාරයක කාර්යයන් සඳහා එම දේපළ තාවකාලිකව පාවිච්චි කිරීමටත් සංස්ථාවට බලය පැවරීම එම ආඥාවේ බලපෑම වන්නේ ය.

(4) බලකර ලබා ගැනීමේ ආඥාවකින් යම් දේපළක් බලකර ලබා ගනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මේ පනතෙහි මින් මතු "බලකර ලබා ගැනීම අත්හැරීමේ ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආඥාවකින් ඒ බලකර ලබා ගැනීම අත්හැරීමේ ආඥාවෙහි දක්වෙන දිනයක සිට ඒ දේපළ පිළිබඳ බලකර ලබාගැනීම අත් හළ හැකි ය.

(5) බලකර ලබා ගැනීම අත්හැරීමේ ආඥාවක් ක්‍රියාත්මක වීමට පෙර අමාත්‍යවරයා විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය විමසීමෙන් පසු, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින්, ඒ බලකර ලබා ගැනීම අත් හැරීමේ ආඥාව ක්‍රියාත්මක වන දිනය කලින් කල වෙනස් කළ හැකි ය.

(6) සංස්ථාව සඳහා යම් දේපළක් බලකර ලබා ගනු ලැබූ දිනයට පෙරාතුව ම යම් බද්දක නියමයන් යටතේ ඒ දේපළෙහි අයිතිකරු නොවන යම් තැනැත්තකු ඒ දේපළෙහි සන්තකයට හිමිකම් ලැබ සිටි අවස්ථාවක ඒ බද්ද ඒ දිනයෙහි අවසන් වී ඇති ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය.

(7) බලකර ලබා ගැනීම අත් හැරීමේ ආඥාවකින් යම් දේපලක් පිළිබඳ බලකර ලබා ගැනීම අත් හල අවස්ථාවක, ඒ දේපල බල කර ලබා ගනු ලැබූ දිනයෙහි වලංගුව පැවති යම් බද්දක් නැවත පණ ගැන්වීමේ බලපෑම ඒ ආඥාවෙහි ඇති ලෙස සැලකිය යුතු අතර, ඒ දේපළ කෙරෙහි හෝ විෂයෙහි හෝ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳ ව පැන නැගිය හැකි යම් ප්‍රශ්නයක් ඒ අනුව නිශ්චය කළ යුතු ය.

බලකර ලබා ගන්නා ලද දේපළ අනිවාර්යයෙන් අත්කර ගැනීම.

54. සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ යම් දේපලක් සංස්ථාවේ යම් නිශ්චිත ව්‍යාපාරයක කාර්යයන් සඳහා ස්ථිර ව අවශ්‍ය වන අවස්ථාවක, සතු කිරීමේ ආඥාවකින් ඒ දේපළ සංස්ථාව සතු කළ හැකි ය.

සතුකිරීමේ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

55. (1) සතු කිරීමේ ආඥාවක බලය ප්‍රකාර යම් චංචල හෝ නිශ්චල දේපලක් සංස්ථාව වෙත සතු වී ඇත ද අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් වන්දි පිළිබඳ නිශ්චයක් කරනු ලැබීමට පෙර යම් විටෙක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මේ වගන්තියෙහි "අවසතු කිරීමේ ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) තදනන්තර ආඥාවකින් ඒ සතු කිරීමේ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(2) යම් චංචල හෝ නිශ්චල දේපලක් සම්බන්ධයෙන් වූ සතු කිරීමේ ආඥාවක් අවසතු කිරීමේ ආඥාවකින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන කවර අවස්ථාවක වුවද, පහත දැක්වෙන විධිවිධාන අදාළ වන්නේ ය :—

(අ) ඒ දේපළ කිසි විටෙකත් ඒ සතු කිරීමේ ආඥාව ප්‍රකාර සංස්ථාව වෙත නො පැවරී තිබුණු ලෙස සැලකිය යුතු අතර, ඒ දේපළ කෙරෙහි හෝ විෂයෙහි වූ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳ ව පැන නැගිය හැකි යම් ප්‍රශ්නයක් ඒ අනු ව නිශ්චය කළ යුතු ය.

(ආ) ඒ දේපළ, ඒ සතු කිරීමේ ආඥාව වලංගු වූ දින සිට බල කර ලබා ගැනීමේ ආඥාවක් මගින් බල කර ලබා ගනු ලැබ ඒ සතු කිරීමේ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ දින සිට බල කර ලබා ගැනීම අත් හැරීමේ ආඥාවකින් බල කර ලබා ගැනීම අත් හරිනු ලැබූ දේපලක් වශයෙන් පැවැති ලෙස හා පවතින ලෙස සැලකිය යුතු ය.

(ඇ) ඒ සතු කිරීමේ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පෙර ඒ දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි සඳහා මේ පනත යටතේ ඉදිරිපත් කරන ලද සියලු හිමිකම් කියා පෑම් සහ ඒ හිමිකම් කියා පෑම් සම්බන්ධයෙන් මේ පනත යටතේ පවත්වනු ලැබූ සියලු නීති කෘත්‍ය ශූන්‍ය හා බල රහිත ලෙස සැලකිය යුතු ය. තවද ඒ දේපළ සම්බන්ධයෙන් වන්දි සඳහා වූ අලුත් හිමිකම් කියා පෑම් මේ පනත යටතේ ඉදිරිපත් කළ හැකි අතර, ඒ දේපළ සම්බන්ධයෙන් වන්දි සඳහා වූ ඒ අලුත් හිමිකම් කියා පෑම් පිළිබඳ ව මේ පනත යටතේ නව නීති කෘත්‍ය පවත්වනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ වෙන යම් විධිවිධානයක හෝ වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන බල පැවැත්විය යුතු ය.

56. (1) අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සභාපති විසින් ඒ වෙනුවෙන් විශේෂයෙන් හෝ සාමාන්‍යයෙන් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු විසින්, සංස්ථාව වෙත සතු කරනු ලැබූ හෝ සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ යම් දේපළක සන්තකය භාර ගත හැකි ය.

සංස්ථාව වෙත සතු කරනු ලැබූ හෝ සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ දේපළවල සන්තකය භාර ගැනීම.

(2) අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සභාපති විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු විසින්, සංස්ථාව වෙත සතු කරනු ලැබූ හෝ සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ යම් දේපළක් පරිහරණය කරන හෝ සන්තකව සිටින තැනැත්තාට භාර දෙනු ලබන හෝ ඒ දේපළ මත හෝ ඒ අසල යම් ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමකින්,—

(අ) දැන්වීමෙහි දක්වෙන දිනයක හා වේලාවක දී හා ස්ථානයක දී සංස්ථාව සඳහා හා වෙනුවෙන් ඒ දේපළ ඒ බලය ලත් නිලධරයා සන්තකයට ගැනීමට අදහස් කරන බව ඒ තැනැත්තාට දැන්විය යුතු ය ; තවද

(ආ) එසේ දක්වෙන දිනයෙහි හා වේලාවෙහි දී ඒ ස්ථානයට පැමිණෙන ලෙසත් ඒ සංස්ථාව සඳහා හා වෙනුවෙන් ඒ දේපළෙහි සන්තකය භාර ගැනීමට ඒ බලය ලත් නිලධරයාට ඉඩ හරින ලෙස හා සහාය වන ලෙසත් සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට හෝ බලය පවරනු ලැබූ ඔහුගේ නියෝජිතයාට නියම කළ යුතු ය.

ඒ දේපළ මෝටර් වාහනයක් වන අවස්ථාවක ඉහත කී දැන්වීම ඒ මෝටර් වාහනය සන්තක ව සිටින තැනැත්තා වෙත කරනු වෙනුවට මෝටර් වාහන පනතෙහි අර්ථානුකූලව ඒ මෝටර් වාහනයේ ලියාපදිංචි කරනු ලැබූ අයිතිකරු වෙත සහ මෝටර් වාහන රෙජිස්ට්‍රාර් වෙත ස්වකීය නම ලියාපදිංචි කරනු ලැබ ඇති යම් තැනැත්තකු වෙත කරනු ලැබිය හැකි ය. අධි. 203.

(3) මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යටතේ යම් තැනැත්තකු වෙත කිරීමට නියමිත යම් දැන්වීමක් ලියාපදිංචි කළ ලිපියකින් තැපැල් මාර්ගයෙන් ඔහු වෙත යවන ලද්දේ නම් ඒ දැන්වීම ඔහු වෙත කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ තමා වෙත කරනු ලැබූ යම් දැන්වීමක යම් නියමයක් කඩ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකරුවෙක් වන්නේ ය.

57. (1) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් 56 වන වගන්තිය යටතේ යම් දේපළක සන්තකය භාර ගැනීමෙන් හෝ සන්තකය භාර ගැනීමෙහි ලා යම් තැනැත්තකු—

සංස්ථාව සඳහා සහ වෙනුවෙන් දේපළක සන්තකය භාර ගැනීම වැළැක්වීම හෝ ඊට බාධා කිරීම.

(අ) වළක්වන, ඔහුට බාධා කරන හෝ විරුද්ධකම් පාන ; හෝ

(ආ) යම් කෙනකු ලවා කෙලින්ම හෝ අන් අයුරකින් වළක්වන, ඔහුට බාධා කරවන හෝ විරුද්ධකම් පාන

සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකරුවෙක් වන්නේ ය.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් යම් දේපළක සන්තකය භාර ගැනීමට 56 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු වෙත දක්වා ඇති හෝ දක්වනු ලැබීමට ඉඩ ඇති යම් බාධාවක් හෝ විරෝධය පෑමක් නිසා ඒ දේපළෙහි සන්තකය භාර ගැනීමට ඔහු අපොහොසත් ව සිටින හෝ තමා එහි ලා අපොහොසත් විය හැකි යැයි ඔහුට සිතෙන අවස්ථාවක, ඒ දේපළ සාමාන්‍යයෙන් තබා තිබෙන හෝ පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය දරන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ වෙනුවෙන් ඒ නිලධරයා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කළ විට සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ඔහු වෙත ඒ දේපළෙහි සන්තකය භාර දෙන ලෙස පිස්කල්ට විධාන කෙරෙන ඒ අධිකරණයේ ආඥාවක් ලැබීමට ඒ නිලධරයාට හිමිකම් තිබෙන්නේ ය.

(3) මහේස්ත්‍රාත් අධිකරණය විසින් පිස්කල් වෙත (2) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ඒ ආඥාව වහාම ක්‍රියාත්මක කළ යුතු අතර ඒ ආඥාව ක්‍රියාත්මක කරනු ලැබූ ආකාරය ලියවිල්ලකින් ඒ අධිකරණය වෙත වාර්තා කළ යුතු ය.

(4) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් පිස්කල් වෙත (2) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඒ ආඥාව සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේ, එය වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ අදහසින් යම් අධිකරණයක ගනු ලැබූ හෝ ආරම්භ කිරීමට අදහස් කර ඇති යම් පියවරක් හේතු කොටගෙන ඒ ආඥාව ක්‍රියාත්මක කිරීම කිසිම ලෙසකින් නතර නොකළ යුතු ය.

(5) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, පිස්කල් විසින් හෝ ඔහුගේ මෙහෙයවීම යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින්, ඒ ආඥාව අදාළ වන යම් චංචල දේපළක් තබා ඇති යම් ස්ථානයකට ඇතුළු වී ඒ චංචල දේපළ අල්ලා ගැනීමට, හෝ ඒ ආඥාව අදාළ වන යම් ඉඩමකට, ගොඩනැගිල්ලකට, ඉදිකිරීමකට හෝ අන් නිශ්චල දේපළකට ඇතුළු වී එය පරිහරණය කරන යම් තැනැත්තකු ඉන් නෙරපීමටත් ඒ චංචල දේපළෙහි, ඉඩමෙහි, ගොඩනැගිල්ලෙහි, ඉදිකිරීමෙහි හෝ අන් නිශ්චල දේපළෙහි, සන්තකය භාර ගැනීමට බලය ලැබුණු තැනැත්තා වෙත සංස්ථාව සඳහා සහ වෙනුවෙන් එහි සන්තකය භාර දීමටත් අවශ්‍ය වන යම් බලයක් පාවිච්චි කළ හැකි ය.

සංස්ථාව සතු කරන ලද දේපළ සම්බන්ධයෙන් වන්දි.

58. සංස්ථාව සතු කරනු ලැබූ යම් දේපළක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවිය යුතු වන්දි මුදල පහත දැක්වෙන විධිවිධාන අනුව නිශ්චය කළ යුතු ය:—

(අ) ඒ දේපළ ඉඩම්වලින් සමන්විත වන විට වන්දි මුදල ඒ දේපළ සංස්ථාව සතු කරනු ලැබූ දිනයෙහි එය විවෘත වෙළෙඳ පොළෙහි විකුණනු ලැබුවේ නම් ප්‍රධාන තක්සේරුකරුගේ මතය අනුව (ඒ ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි හැර) ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිලට සමාන විය යුතු ය;

(ආ) ඒ දේපළ යම් ගොඩනැගිල්ලකින්, පොළවට සවිකරන ලද යම් දෙයකින්, පොළවට සවිකරන ලද යම් දෙයකට ස්ථිර වශයෙන් සම්බන්ධ කරන ලද දෙයකින් හෝ, අන් කිසි ස්ථිර වත්කමකින් හෝ වාහනයකින් හෝ ලී බඩුවලින් සමන්විත වන විට වන්දි මුදල—

(i) සතු කිරීමට පෙරාතුවම වූ ඒ දේපළෙහි අයිතිකරු එය මිලට ගෙන ඇති විට හා යම් ඉඩමක් සඳහා හැර ඒ දේපළ සඳහා ඔහු විසින් ඇත්ත වශයෙන් ගෙවන ලද මුදල නිශ්චය වශයෙන් දැනගත හැකි විට, ඒ දේපළ ක්ෂයවීම සඳහා යුක්තිසහගත යයි ප්‍රධාන තක්සේරුකරු සලකන මුදලකින් අඩු ඒ මුදල; නැතහොත්

(ii) සංස්ථාව වෙත සතු කිරීමට පෙර විගණනය කරනු ලැබූ අන්තිම ශේෂ පත්‍රය පිළියෙල කිරීමෙන් පසු ඒ දේපළෙහි ක්ෂයවීම සඳහා යුක්තිසහගත යයි ප්‍රධාන තක්සේරුකරු සලකන මුදලකින් අඩු ඒ විගණනය කරනු ලැබූ ශේෂ පත්‍රයෙහි දැක්වෙන ඒ දේපළෙහි ශුද්ධ පොත් වටිනාකම

යන මින් අඩු මුදල කුමක් ද එය වන්නේ ය.

(ඇ) ඒ දේපළ (වාහන හා ලී බඩු නොවන) යම් චංචල දේපළකින් හෝ යම් ජංගම වත්කමකින් සමන්විත වන විට, වන්දි මුදල, ඒ දේපළ මිලට ගැනීමේ දී හෝ නිපදවීමේ දී ඇත්ත වශයෙන් දරනු ලැබූ වියදම හෝ ඒ දේපළ සංස්ථාව වෙත සතු කරනු ලැබූ දිනයෙහි එය විවෘත වෙළඳ පොළෙහි විකුණනු ලැබුවේ නම් ප්‍රධාන තක්සේරුකරුගේ මතය අනුව ඒ සඳහා ලැබිය හැකිව තිබුණු මුදල යන මේ දෙකෙන් අඩු මුදල කුමක් ද එය විය යුතු ය.

(ඈ) ඒ දේපළ (විධිමත් වූ හෝ විධිමත් නොවූ) යම් එකඟවීමක, බද්දක හෝ නොතාරිස් ඔප්පුවක නියමයන් අනුව ලැබුණා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් පිළිබඳ අයිතිවාසිකමක්, සම්බන්ධතාවක් හෝ ප්‍රතිලාභයක් වන විට වන්දි මුදල ඒ අයිතිවාසිකම, සම්බන්ධතාව හෝ ප්‍රතිලාභය අත්කර ගැනීම සඳහා එය දරන්නා හෝ ඔහුගේ පූර්වගාමියා ඇත්ත වශයෙන් ගෙවූ මිල වන්නේ ය:

එසේ වුවද ඒ අයිතිවාසිකම, සම්බන්ධතාව හෝ ප්‍රතිලාභය දරන්නා හෝ ඔහුගේ පූර්වගාමියකු වී නම් ඔහු එය භුක්තිවින්ද වූ යම් කාලයක් වී නම් ඒ කාල සීමාව වෙනුවෙන් අනුපාතික මුදලක් වන්දි මුදලෙන් අඩු කළ යුතු ය.

**59.** සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ යම් දේපළක් සම්බන්ධයෙන් වූ විට, ඒ දේපළ තාවකාලික ව පාවිච්චි කිරීම සඳහා ගෙවනු ලැබිය යුතු යයි යුක්තිසහගත ව බලාපොරොත්තු විය හැකි මුදලට සමාන වන්දියක් සංස්ථාව විසින් ගෙවිය යුතු ය.

සංස්ථාව සඳහා බලකර ලබාගනු ලැබූ දේපළ සම්බන්ධයෙන් වන්දි.

යම් නිශ්චිත ව්‍යාපාරයක නියුක් තවීමේ හෝ එවැනි ව්‍යාපාරයක් කර ගෙන යාමේ තනි අයිතිය සංස්ථාව සතුකිරීමේ හේතු වෙන් ඇති වූ හානියක් හෝ පාඩුවක් සඳහා වන්දි නොගෙවිය යුතු බව.

60. 50 වන වගන්තියෙහි විධිවිධාන හෝ ඒ විධිවිධාන යටතේ කරනු ලැබූ යම් ආඥාවක් ක්‍රියාත්මක වීම කරණකොටගෙන යම් නිශ්චිත ව්‍යාපාරයක නියුක්තවීමේ හෝ එවැනි ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමේ තනි අයිතිය සංස්ථාව සතු කරනු ලැබීමේ හේතුවෙන් කෙලින් ම හෝ අන් අයුරකින් හෝ ව්‍යාපාරික වශයෙන් හෝ අන් ලෙසකින් තමාට සිදු වන යම් පාඩුවක් සඳහා වන්දියක් ලැබීමට කිසිම තැනැත්තකුට හිමිකම් නො ලැබෙන්නේ ය.

වන්දි සඳහා වූ පොලිය.

61. මේ පනත යටතේ යම් වන්දියකින් කළ හැකි යම් අඩු කර ගැනීම් කපා ගැනීමෙන් පසු ගෙවිය යුතු වන යම් වන්දි මුදලක් සඳහා, වන්දිය අයත්වී ගෙවිය යුතු වන දිනයේ සිට එය ගෙවනු ලබන දිනය තෙක්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයන් අනුව පොලිය ගෙවිය යුතු ය.

වන්දිය අයත් වනුයේකෙදිනක සිටද යන බව.

62. යම් දේපළක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය ඒ දේපළ සංස්ථාව වෙත සතු කරනු ලැබූ හෝ එය සඳහා බල කර ලබා ගනු ලැබූ දිනයෙහි සිට අයත් වන ලෙස සැලකිය යුතු ය.

වන්දි ගෙවීමේ ක්‍රමය.

63. වන්දි ගෙවීමේ ක්‍රමය මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු ය.

වන්දි නිශ්චය කිරීම.

64. (1) යම් දේපළක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය නිශ්චය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන තක්සේරුකරු වෙත යොමු කළ යුතු අතර, ඒ තක්සේරුකරු විසින් තම නිශ්චය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) යම් දේපළක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි ප්‍රමාණය තමා විසින් නිශ්චය කිරීමට පෙර ඒ දේපළ සංස්ථාව සතු කරන ලද්දේ හෝ එය සඳහා බලකර ලබා ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාට මෙන් ම අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිට ද ඔහු විසින් ම හෝ ඒ සඳහා ඔහු විසින් බලය පවරනු ලබන නියෝජිතයකු මාර්ගයෙන් ඒ දේපළෙහි වටිනාකම පිළිබඳ සාක්ෂි තමා ඉදිරියේ දැක්වීමට ප්‍රධාන තක්සේරුකරු විසින් අවස්ථාවක් දිය යුතු ය.

(3) යම් දේපළක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය පිළිබඳ ව ප්‍රධාන තක්සේරුකරු විසින් කරන ලද නිශ්චය කිරීම සංස්ථාව සඳහා ඒ දේපළ සතු කරන ලද්දේ හෝ බල කර ලබා ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(4) යම් දේපළක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙවීමට අදහස් කරන, ප්‍රධාන තක්සේරුකරු විසින් නිශ්චය කරනු ලැබූ වන්දිය වන වන්දි මුදල දක්වමින් ද ඒ දේපළ සංස්ථාව සතු කරනු ලැබීමට හෝ එය සඳහා බලකර ලබා ගැනීමට පෙරාතුව ම ඒ දේපළ පිළිබඳ යම් සම්බන්ධතාවක් දැරුවා වූ හා ඒ දේපළ සම්බන්ධයෙන් යම් වන්දියකට හිමිකම් කියා පාන්නා වූ යම්

තැනැත්තකුගේ හිමිකම් පෑම, ඒ හිමිකම් පෑමෙහි ස්වභාවය සහ එයට පදනම් වූ කරුණු සඳහන් කරමින්, දැන්වීමෙහි දැක්වෙන දිනයකට පෙර ලියවිල්ලකින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කරන ලෙස දන්වමින් ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගැසට් පත්‍රයෙහි සහ යටත් පිරිසෙයින් එක් පුවත් පතක දැන්වීමක් පළ කිරීමට සැලැස්විය යුතු ය.

වන්දි ගෙවීම.

**65.** (1) යම් දේපළක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි සඳහා 64 වන වගන්තිය යටතේ වූ දැන්වීමට පිළිතුරු වශයෙන්, ඒ දේපළ සංස්ථාව අත්කර ගන්නා ලද්දේ හෝ එය සඳහා බලකර ලබා ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා නොවන යම් තැනැත්තකුගෙන් කිසිදු හිමිකම්පෑමක් නොලැබුණු අවස්ථාවක ඒ වන්දි මුදල, ඉන් අඩු කර ගැනීමට මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත යම් මුදලක් අඩු කර ගැනීමෙන් පසු, ඒ දේපළ එසේ අත් කර ගනු ලැබුවේ හෝ බල කර ලබා ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාට ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සභාපති විසින් සැලැස්විය යුතු ය.

(2) යම් දේපළක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය සඳහා 64 වන වගන්තිය යටතේ වූ දැන්වීමට පිළිතුරු වශයෙන්, ඒ දේපළ සංස්ථාව අත්කර ගන්නා ලද්දේ හෝ එය සඳහා බලකර ලබා ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා නොවන යම් තැනැත්තකුගෙන් යම් හිමිකම් පෑමක් ලැබුණු අවස්ථාවක, ඒ සෑම හිමිකම් පාන්නකු ද ඒ දේපළ සංස්ථාව එසේ අත්කර ගන්නා ලද්දේ හෝ එය සඳහා බල කර ලබා ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා ද වන්දි ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් හා වන්දි මුදල තමන් අතර කොටස් කර බෙදා ගත යුතු ආකාරය පිළිබඳ ව ලියවිල්ල කින් සමාදානයෙන් එකඟත්වයට පත් වුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින්, මේ පනතින් හෝ එය යටතේ වන්දි යෙන් අඩු කර ගැනීමට නියමිත යම් මුදලක් ඉන් අඩු කර ගෙන, ඒ එකඟවීම අනු ව ඒ තැනැත්තන් අතර වන්දි මුදල කොටස් කර බෙදා දීමට සැලැස්විය යුතු ය. එවැනි එකඟවීමක් ඇති නොවූවහොත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින්, මේ පනතින් හෝ එය යටතේ වන්දියෙන් අඩු කර ගැනීමට නියමිත යම් මුදලක් වන්දියෙන් අඩු කර ගෙන, වන්දියට හිමිකම් ඇති තැනැත්තන් විසින් ලබා ගනු පිණිස, ගෙවීමට ඇති මුදලේ ප්‍රමාණය රුපියල් හත් සිය පණහට වැඩි වීම හෝ නොවීම අනුව යම් දිසා අධිකරණයක්ට හෝ රික්වෙස්ට් අධිකරණයකට වන්දි මුදල ගෙවනු ලැබීමට සැලැස්විය යුතු ය.

වන්දිය නොපිළිගන්නා අවස්ථා ආදිය සම්බන්ධයෙන් විධිවිධාන.

**66.** මේ පනත යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු යම් වන්දි මුදලක් ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබූ කල්හි ඔහු එය නොපිළිගන්නා අවස්ථාවක හෝ ඒ තැනැත්තා මිය ගොස් ඇති හෝ නොමැති හෝ කවරෙක්දැයි නොදන්නා අවස්ථාවක, ඊට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින් ලබා ගනු පිණිස, වන්දි මුදලේ ප්‍රමාණය රුපියල් හත්සිය පණහට වැඩි වීම හෝ නොවීම අනුව යම් දිසා අධිකරණයකට හෝ රික්වෙස්ට් අධිකරණයකට එය ගෙවිය යුතු ය.

වන්දියෙන් අඩුකිරීම.

**67.** (1) සංස්ථාව සතු කරනු ලැබූ හෝ සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ යම් දේපළක් සම්බන්ධයෙන් වන්දි ලැබීමට යම් තැනැත්තකුට හිමිකම් ඇති අවස්ථාවක, දේශීය ආදායම් කොමසාරිස් විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන හෝ ක්‍රියාවෙහි යොදවනු ලැබූ යම් ලිඛිත නීතියක් යටතේ යම් බද්දක් වශයෙන් හෝ අය කිරීමක් වශයෙන් ඒ තැනැත්තාගෙන් අය විය යුතු යැයි දේශීය ආදායම් කොමසාරිස්ගේ අත්සන යටතේ සංස්ථාවට සහතික කරනු ලබන යම් මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ වන්දි මුදලින් දේශීය ආදායම් කොමසාරිස්ට ගෙවිය යුතු ය.

(2) මේ වගන්තියෙහි කාර්යයන් සඳහා, "වන්දිය" යන යෙදුමට එවැනි වන්දි මුදලකට එකතු වී අයවිය යුතුව ඇති යම් පොලියක් ද ඇතුළත් වේ.

## VI වන කොටස

## සාමාන්‍ය කරුණු

නිෂ්පාදනය අඩු කිරීම.

**68.** ජාතික යහපත තකා එසේ කිරීම අවශ්‍ය යැයි අමාත්‍යවරයා අදහස් කරනහොත්, තමා විසින් දක්වනු ලබන ප්‍රමාණයකට යම් ඛනිජ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම අඩු කරන ලෙස යම් පතලක අයිතිකරුට හෝ කළමනාකරුට අමාත්‍යවරයා විසින් නියම කළ හැකි ය.

නිශ්චල දේපළ අත්කර ගැනීම.

**69.** (1) කැණීමේ කාර්යයන් සඳහා යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් අයිතිවාසිකමක් අත් කර ගැනීමට බලපත්‍රයක් දරන්නා අපොහොසත් වී ඇතැයි අමාත්‍යවරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඒ ඉඩම හෝ ඒ ඉඩමෙහි යම් අයිතිවාසිකමක් අත් කර ගැනීමට ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් ඔහු විසින් අනුමතිය දිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය අනුව ආඥාවක් එසේ පළ කරනු ලැබූ අවස්ථාවක පොදු කාර්යයක් සඳහා ඒ දේපළ අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ ඒ දේපළ අත් කර ගෙන එය බලපත්‍රය දරන්නා වෙත ඒ පනත යටතේ පවරනු ලැබිය යුතු ය.

අධි. 460.

(3) ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් අයිතිවාසිකමක් අත් කර ගැනීම සඳහා හෝ වන්දි වශයෙන් හෝ ගෙවිය යුතු යම් මුදලක් බලපත්‍රය දරන්නා විසින් ගෙවිය යුතු ය.

අධි. 460.

ජනරජයට අයිති ඉඩම සම්බන්ධයෙන් සහ බලපත්‍රය අවසන් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සම්බන්ධයෙන් විධිවිධාන.

**70.** බලපත්‍රය දරන්නකුට රජයේ ඉඩම් ආඥාපනත යටතේ සතු කර දෙනු ලැබූ ජනරජයට අයිති යම් ඉඩමක්, මේ පනතෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ බලපත්‍රය අවසන් වූ විට හෝ අවලංගු වූ විට එහි වැඩි දියුණු කිරීම් කිසිවක් කර තිබේ නම් ඒවාද සහිතව ජනරජයට නැවත සතුවිය යුතු අතර, ඒ බලපත්‍රය දරන්නා මගින්, ඔහුගෙන් හෝ ඔහු යටතේ හිමිකම් දක්වන කිසි ම තැනැත්තකුට ඒ ඉඩම පිළිබඳ කිසිදු හිමිකමක් නො තිබිය යුතු අතර ඒ තැනැත්තා විසින් ඒ ඉඩම පිළිබඳ හෝ එහි යම් සම්බන්ධතාවක් පිළිබඳ හිමිකම් පෑමක් නො කළ යුතු ය; නැතහොත් ඒ වැඩිදියුණු කිරීම් කිසිවක් සඳහා වූ යම් වන්දියකට ඔහු හිමිකම් නො ලැබෙන්නේ ය.

අධි. 454.

**පතලෙහි බලපත්‍රලාභියාගේ, නියෝජිතයාගේ හා කළමනාකරුගේ වගකීම.**

71. (1) පතලෙහි හෝ ඊට සම්බන්ධව පවත්වා ගෙන යනු ලබන සියලු කටයුතු මේ පනතෙහි විධිවිධානවලට සහ එය යටතේ සාදනු ලබන හා ඒ පතලට අදාළ වන නියෝගවලට අනුකූල ව පවත්වා ගෙන යනු ලබන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු පියවරවල් ගැනීම සඳහා පතලෙහි බලපත්‍රලාභී හෝ ඔහුගේ නියෝජිතයා හා කළමනාකරු වගකිව යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් විධිවිධාන අතුරින් කිසිවක් කඩ කරනු ලැබුවහොත්, කඩ කිරීම කළ තැනැත්තාට අතිරේකව පතලෙහි බලපත්‍රලාභී හෝ ඔහුගේ නියෝජිතයා සහ කළමනාකරුද, ඒ කඩ කිරීම වැළැක්වීම පිණිස තමා විසින් සියලු සාධාරණ ආරක්ෂා විධිවිධාන යොදනු ලැබූ බව ඔප්පු කළහොත් මිස, ඒ කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු වන්නේ ය.

**වැරදි.**

72. (1) මේ පනත අනුව අධ්‍යක්ෂ විසින් හෝ විධානයක් දීමට අධ්‍යක්ෂ විසින් බලය පවරා ඇති යම් නිලධරයකු විසින් දෙනු ලැබූ යම් විධානයක් අනුව ක්‍රියා කිරීම නොකර හරින, පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තෙක්ම මේ පනත යටතේ වරදකරුවෙක් වන්නේ ය.

(2) මේ පනතෙහි විධිවිධාන අතුරින් කිසිවක් හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයකට අදාළ කොන්දේසි අතුරින් කිසිවක් පිළිබඳ සෑම කඩකිරීමක්ම මේ පනත යටතේ වරදක් වන්නේ ය.

(3) මේ පනතින් පැවරෙන හෝ නියම කෙරෙන යම් බලයක් පාවිච්චි කරන හෝ යම් කාර්යයක් ඉටු කරන අධ්‍යක්ෂට හෝ 16 වන වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති යම් බලයක් පාවිච්චි කරන හෝ යම් කාර්යයක් ඉටු කරන යම් නිලධරයකුට අවහිර කරන, ඔහු වළක්වන හෝ ප්‍රමාද කරන සෑම තැනැත්තෙක්ම මේ පනත යටතේ වරදකරුවෙක් වන්නේ ය.

**දණ්ඩන.**

73. මේ පනත යටතේ වරදකරුවකු වන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට—

(අ) පළමු වරදක් සම්බන්ධයෙන් වූ විට, රුපියල් පන් සියයකට නො වැඩි දඩයකට හෝ මාස හයකට නො වැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම ; සහ

(ආ) දෙවැනි හෝ ඉන් අනතුරුව කෙරෙන වරදක් සම්බන්ධයෙන් වූ විට, රුපියල් එක් දහසකට නො වැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නො වැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම

යටත් විය යුතු ය.

**පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.**

74. මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක,—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත කරන ලද මණ්ඩලයක් නම් ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකු ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයෙහි සෑම හවුල්කරුවකුම

වරදකරුවකු ලෙස සැලකිය යුතු ය :

එසේ වුවද තමාගේ දැනීම නොමැතිව ඒ වරද සිදු කරනු ලැබූ බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු විසින් හෝ නිලධරයකු විසින් හෝ ඒ ව්‍යාපාරික ආයතනයෙහි හවුල් කරුවකු විසින් ඔප්පුකරනු ලැබුවහොත් ඔහු වරදකරුවකු ලෙස නොසැලකිය යුතු ය.

නියෝග. 75. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ ඵලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තියෙන් පැවරුණු බල තලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින්—

(අ) නියම කළ යුතු යයි ප්‍රකාශිත හෝ නියමිත හෝ නියෝග සාදනු ලැබීමට බලය පැවරී ඇති හෝ නියම වී ඇති සියලු කරුණු සම්බන්ධයෙන් ; සහ

(ආ) බලපත්‍ර දරන්නන්ගේ අයිතිවාසිකම්, බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි සහ ඒවා නිකුත් කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව ද ඇතුළුව බලපත්‍රවලට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන්

නියෝග සෑදිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර නියෝගයෙහි දක්වෙන දිනයක හෝ එවැනි දිනයක් එසේ දක්වා නොමැති නම් එසේ පළ කරනු ලබන දිනයෙහි එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම එය පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් ඒ නියෝගය අනුමත කළ යුතු ය යන යෝජනාවක් මගින් ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) ජාතික රාජ්‍ය සභාව අනුමත කිරීම ප්‍රතික්ෂෙප කරන සෑම නියෝගයක්ම එසේ ප්‍රතික්ෂෙප කිරීමේ දිනයෙහි සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් එය යටතේ කලින් කරන ලද යම් දෙයක වලංගුභාවයට ඉන් හානියක් නො විය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

ඉවත් කිරීම. 76. 1896 පතල් හා යන්ත්‍රෝපකරණ ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

77. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"අධ්‍යක්‍ෂ" යන්නෙන් භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂවරයා අදහස් වේ ;

"කම්කරුවා" යන්නෙන් පතලක ඇත්ත වශයෙන් ම කෙරෙන ක්‍රියා මාර්ග හෝ කටයුතු කිසිවක හෝ යන්ත්‍රෝපකරණවල හෝ ස්ථානයෙහි යම් කොටසක් පිරිසිදු කිරීමෙහි හෝ වෙනත් ක්‍රියා මාර්ග හෝ කටයුතු කිසිවක වේතන ගෙවා හෝ නොගෙවා සේවයෙහි යොදවනු ලබන යම් තැනැත්තෙක් අදහස් වන නමුදු ලිපිකරුවකු වශයෙන් ම පමණක් සේවයෙහි යොදවනු ලබන යම් තැනැත්තෙක් අදහස් නොවේ ;

"කළමනාකරු" යන්නෙන් ගෙවීමක් ලබා හෝ නො ලබා, එල දායී ලෙස පතලක් භාරව සිටින හෝ එය පාලනය කරන තැනැත්තා අදහස් වේ ;

"ඛනිජ ද්‍රව්‍යය" යන්නෙන් පොළොවෙහි හෝ පොළොව මතුපිට හෝ මහාද්වීපික තටකයේ ඝන, ද්‍රව හෝ වායු තත්ත්වයේ පවතින්නාවූ ද ස්වභාවිකව හටගන්නා වූද යම් ද්‍රව්‍යයක් අදහස් වන අතර ඊට හයිඩ්‍රෝකාබන් හෝ ජලය ඇතුළත් නොවේ ;

"ජංගම වත්කම" යන්නෙන් මුදල් හා විකිණීමේ කාර්යය සඳහා හෝ විකිණීම සඳහා යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා හෝ අත්කරගනු ලැබූ යම් වත්කම් අදහස් වන අතර නිෂ්පාදනය කිරීමේ කවර අවස්ථාවක වුව ද පවතින එබඳු යම් වත්කමක් එයට ඇතුළත් වේ ;

"දිනය" යන්නෙන් මධ්‍යම රාත්‍රියෙහි ආරම්භ වන පැය විසි හතරක කාලසීමාව අදහස් වේ ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නියම කරනු ලැබූ බව අදහස් වේ ;

"පතල" යන්නෙන් යම් ඛනිජ ද්‍රව්‍යයක් සෙවීමේ හෝ ලබා ගැනීමේ කාර්යය සඳහා පොළෝ තලය මතු පිට හෝ ඉන් පහළ කෙරෙන යම් කැණීමක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ ;

"බාලයා" යන්නෙන් වයස අවුරුදු දහ හතර සම්පූර්ණ කර සිටින, එහෙත් වයස අවුරුදු දහ අට සම්පූර්ණ කර නොමැති තැනැත්තෙක් අදහස් වේ ;

"රාත්‍රිය" යන්නෙන් සවස් කාලයෙහි හතේ සිට උදය කාලයෙහි හය අතර වූ කාලසීමාව අදහස් වේ ;

"වැඩිහිටියා" යන්නෙන් වයස අවුරුදු දහ අට සම්පූර්ණ කර සිටින තැනැත්තෙක් අදහස් වේ ;

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයෙක් අදහස් වේ;

"ස්ථිර වත්කම" යන්නෙන් ව්‍යාපාරයෙහි නොකඩවම පාවිච්චි කිරීම සඳහා මිස මුදල්වලට පරිවර්තනය කිරීම සඳහා නොවූ යම් වත්කමක් අදහස් වේ.